**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11** |
| **Third Term Test 2020** | **Grade 11** |

| | |
|---|---|
| **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I** | **පැය එකයි** |
| தொடர்பாடலும் ஊடகவியற் கற்கையும் I | ஒன்று மணித்தியாலம் |
| Communication & Media Studies I | One hours |

◆ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. කමල් තම සටහන් පොත කියවමින් සිටී. එහි එන සන්නිවේදන මූලිකාංග වල අනුපිළිවෙල කුමක්ද?

i. සන්නිවේදකයා ⟶ පොත් ප්‍රකාශකයා ⟶ ග්‍රාහකයා
ii සන්නිවේදකයා ⟶ පණිවිඩය ⟶ ග්‍රාහකයා
iii. පොත් ප්‍රකාශක ⟶ පණිවිඩය ⟶ ග්‍රාහකයා
iv. සන්නිවේදකයා ⟶ නාලිකාව ⟶ පණිවිඩය

02. වැසි අවස්ථාවක කඩපිලකට එක් රොක් වන පිරිසක් අතර ඇතිවන සන්නිවේදනය

i. අන්තර් පුද්ගල සන්නිවේදනය
ii. විධිමත් සන්නිවේදනය
iii. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
iv. අවිධිමත් සන්නිවේදනය

03. ශ්‍රී ලංකාවේ මාධ්‍ය හිමිකාරීත්වයේ ප්‍රධාන බෙදීම් දෙක වන්නේ,

i. රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය
ii. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය මාධ්‍ය
iii. සමාගම් හා තනි පුද්ගල මාධ්‍ය
iv පවුල් හා රාජ්‍ය මාධ්‍ය

04. වැදගත් ම තොරතුරු (කරුණු) මුලින් ම ඉදිරිපත් කරමින් සිදු කරන්නේ,

i. දෘඩ පුවත් වාර්තාකරණයේ දී
ii. මෘදු පුවත් වාර්තාකරණයේ දී
iii. ගවේශනාත්මක වාර්තාකරණයේ දී
iv. නිර්මාණාත්මක වාර්තාකරණයේ දී

05. මිනිස් හඬ, සංගීතය හා බාහිර ශබ්ද උපයෝගී කරගනිමින් සමීපයේ නැති දේ පවා මවා පෙන්වීමේ ගුවන් විදුලියට සුවිශේෂී ගුණය,

i. චිත්ත රූප දැකීම යි
ii. රූප සංජානනය යි
iii. පරිකල්පන ශක්තිය යි
iv. භාව සංවේදී බව යි

06. නව මාධ්‍ය පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න

i. රූපවාහිනිය, කෙටි පණිවිඩ, සමාජ ජාලා

ii. විද්‍යුත් තැපැල, සමාජ ජාල, කෙටි පණිවිඩ

iii. අන්තර්ජාල පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය

iv. රූපවාහිනිය, වෙබ් රේඩියෝ, විද්‍යුත් තැපැල

07. සෝදුපත් කියවීම යනු,

i. භාෂාත්මක දෝෂ නිවැරදි කිරීම සඳහා කියවීම යි

ii. අත් පිටපත හා මුද්‍රිත පිටපත සසඳමින් කියවීම යි

iii. නිවැරදි අක්ෂර සංයෝජනය සඳහා කියවීම යි

iv. මුද්‍රණ හා ව්‍යාකරණ දෝෂ සකස් කරමින් කියවීම යි

08. ශ්‍රී ලංකාවේ පලවන දිනපතා හා සති අන්ත පුවත්පත් හඳුන්වන්නේ එහි ප්‍රමාණය අනුව,

i. බ්‍රෝඩ්ෂීට් ය. ii. ටැබ්ලොයිඩ් ය.

iii. ෆුල් ඩිමයි ය. iv. කොම්පැක්ට් ය.

09. අභිමානිට ලැබුණ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයට අයත් ප්‍රශ්න පත්‍රයේ ඇය අතින් ම තීන්ත තැවරීමෙන් ප්‍රශ්න දෙකක් ම කියවා අවබෝධ කරගත නොහැකි විය. මෙය,

i. අර්ථ බාධකයකි. ii. මාධ්‍ය බාධකයකි.


iii. දෘශ්‍ය බාධකයකි. iv. තාක්ෂණික බාධකයකි.

10. මා ලියූ කෙටිකතා සංග්‍රහය මුද්‍රණය කර බෙදා හැරීමට ප්‍රසිද්ධ ප්‍රකාශන සමාගමක් භාරගත් අතර, මුද්‍රිත පිටපත් ප්‍රමාණය මත මා වෙත මුදල් හිමිවිය. මෙම ප්‍රතිලාභය,

i. බුද්ධිමය දේපලකි. ii. ආර්ථික අයිතිවාසිකමකි.

iii. කර්තෘ භාගය යි. iv. ප්‍රකාශණ හිමිකම යි.

11. පහත දළ සටහන අනුව 11 හා 12 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




ඉහත දළ සටහනට අනුව A සහ C අක්ෂර වලින් නිරූපණය කරන්නේ,

i. ග්‍රාහකයා සහ අග්‍රස්ථානය යි. ii. සන්නිවේදකයා සහ සංදේශය යි.

iii. සන්නිවේදකයා සහ ඝෝෂාව යි. iv. තොරතුරු මූලාශ්‍රය සහ ඝෝෂාව යි.

12. ඉහත දළ සටහනට සමාන සන්නිවේදන ආකෘතියක් ඉදිරිපත් කළ විද්වතුන් දෙදෙනා වන්නේ,

i. විල්බර් ශ්‍රාම් හා හැරල්ඩ් ඩී ලැස්වෙල් ii. ක්ලෝඩ් ශැනොන් හා විල්බර් ශ්‍රාම් ය.

iii. වොරන් වීවර් හා ක්ලෝඩ් ෂැනොන් ය. iv. ක්ලෝඩ් ශැනොන් හා විල්බර් ශ්‍රාම් ය.

13. පාඩමක් අතරතුර මාධ්‍ය විෂයය උගන්වන ගුරුතුමිය පෙළපොතේ වූ රූපයක් පුළුල් තිරයක් ආධාරයෙන් පන්තියේ ප්‍රදර්ශනය කළා ය. ඇය ඒ සඳහා යොදාගත්තේ,

i. බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. ii. ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.

iii. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි. iv. කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.

14. දෙකොන හෝ සිව්කොණ දල්වූ ගිණිබෝල සහිත වළල්ලක් වේගයෙන් කරකවන විට ගිනි වළල්ලක් සේ දැකීමේ සිද්ධාන්තය වන්නේ,

i. අක්ෂි සබඳතාව යි. ii. දෘෂ්ටි මායාව යි.

iii. අවිදූර දෘෂ්ටිකත්වය යි iv. දෘෂ්ටියේ අඛණ්ඩතාව යි.

15. මහාචාර්ය හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ සන්නිවේදන අර්ථකථනය පිළිබඳ <u>සාවද්‍ය</u> ප්‍රකාශය කුමක්ද?

i. සන්නිවේදකයාට වැඩි වැදගත්කමක් හිමි වෙයි.

ii. සන්දේශයට තාක්ෂණික බාධා එල්ල වෙයි.

iii. සන්දේශය ග්‍රාහකයා තුළ වෙනසක් ඇති කරයි.

iv. හැමවිටම ඒකමාර්ගීය සන්නිවේදනයක් සිදු වේ.

16. ''සෑම උද්වේගකාරී ආරංචියක් ම ප්‍රවෘත්තියකි'' මෙය ප්‍රකාශ කළේ,

i. චාර්ලිස් ඇන්ඩර්සන් ය. ii. ජෝන් ලොක් ය.

iii. ජෝන් ලොගී බෙයාර්ඩ් ය. iv. මිල්ටන් බ්‍රෂ් ය.

17. බුද්ධිමය දේපළ පනතට අනුව සදාචාරමය අයිතිවාසිකම,

i. නිර්මාණකරුවාගේ අනන්‍යතාව හා සම්බන්ධ වූවකි.

ii. අවශ්‍ය විටක අන්සතු කළ හැකි වේ.

iii. මූල්‍යමය ප්‍රතිලාභ ගෙන දෙන්නකි.

iv. නීතිමය පිළිගැනීමකට ලක් නොවන්නකි.

18. ''ප්‍රදීපාගාර ක්‍රමය'' වඩාත් යෝග්‍ය වන්නේ,

i. පුද්ගලාන්තර සන්නිවේදනයට ය.

ii. ජන සන්නිවේදනයට ය.

iii. සමූහ සන්නිවේදනයට ය.

iv. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට ය.

19. නිර්මාණකරුවෙකුගේ ජීවන තොරතුරු හා ඔහුගේ නිර්මාණ පිළිබඳ ව විස්තර ඇතුළත් ගුවන් විදුලි වැඩසටහනක් සඳහා වඩාත් උචිත වැඩසටහන් ආකෘතිය වන්නේ,

i. සඟරාමය ආකෘතිය යි. ii. සංගීත වැඩසටහන් ආකෘතිය යි.

iii. වාර්තා වැඩසටහන් ආකෘතිය යි. iv. සම්මුඛ සාකච්ඡා ආකෘතිය යි.

20. පෝල් ඩී මැසෙනියර්ගේ ප්‍රවෘත්ති පිළිබඳ සමීකරණයට අනුව, මුල් කරුණු තුන ඉටුවීමෙන් ප්‍රවෘත්තියකට ලැබෙන්නේ,

i. නිවැරදි බව යි. ii. විශ්වාසනීයත්වය යි.

iii. පැහැදිලි බව යි. iv. සමතුලිත බව යි.

21. ඡායාරූපයක විභේදන බලය යනු,

i. වර්ග අඟලක් තුළ පවතින පික්සල් සංඛ්‍යාව යි. ii. පටල වේගයේ අඩු වැඩි බව යි.

iii. ක්ෂේත්‍ර ගැඹුර අඩු වැඩි කිරීමේ හැකියාව යි. iv. ආලෝක අනාවරණ කාලය යි.

22. ශ්‍රී ලංකාවේ අරඹන ලද ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාව වන්නේ,


i. මහනුවර සේවය ii. මහවැලි සේවය

iii. රජරට සේවය iv. රුහුණු සේවය

23. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශන නිදහසට යම් යම් සීමා ඇති කරන අනු ව්‍යවස්ථා ඇතුළත් වරණය තෝරන්න.

i. (14) (1) හා (2) වගන්ති ii. (17) (2) හා (3) වගන්ති

iii. (19) (2) හා (7) වගන්ති iv. (5) (2) හා (7) වගන්ති

24. 


ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ,

i. චක්‍රීය ආකෘතිය යි ii. දාම ආකෘතිය යි

iii. වයි ආකෘතිය යි iv. රෝද ආකෘතිය යි

25. විනිවිදක පත්‍ර භාවිතා කරන ප්‍රක්ෂේපණීය මාධ්‍ය උපකරණය වන්නේ,

i. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය ii. කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය

iii. බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය iv. ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය

26. ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී නාලිකාව වන්නේ,

i. ජාතික රූපවාහිනිය ii. ස්වාධීන රූපවාහිනිය

iii. ස්වර්ණවාහිනිය iv. දෙරණ රූපවාහිනිය

27. කැමරාවක අනිවාර්යයෙන් ම පිහිටිය යුතු කොටස් ඇතුළත් වරණය වන්නේ,

i. කැමරා කාචය, කැමරා බඳ, ද්වාරය ii. ද්වාරය, කාච විවරය. සේයා පටලය

iii. කැමරා කාචය, ද්වාරය, කාච විවරය iv. කාච විවරය, ද්වාරය, සේයා පටලය

28. රජයට හිමිකම ඇති ජනමාධ්‍ය ආයතන අයත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

i. ලේක්හවුස් ආයතනය හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

ii. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා හිරු නාලිකාව

iii. ස්වාධීන රූපවාහිනිය හා ස්වර්ණවාහිනිය

iv. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා දෙරණ රූපවාහිනිය

29. ලබාගත් ඡායාරූපයක් ඒ මොහොතේ ම නැරඹීමට හැකියාව ලැබෙන්නේ,

i. රසායනික ඡායාරූපකරණයේ දී ය. ii. ඒකකාච කැමරා ඡායාරූපයක් මඟිනි.

iii. රසායනික ඡායාරූපකරණයේදී ය. iv. අංකිත ඡායාරූපකරණයේ දී ය.

30. ස්ත්‍රී, පුරුෂ සමාජභාවය නමැති සංකල්පය,

i. සාම්ප්‍රදායික වූවකි. ii. සමාජ විද්‍යාත්මක වූවකි.

iii. ජීව විද්‍යාත්මක වූවකි. iv. මනෝ විද්‍යාත්මක වූවකි.

31. පහත දැක්වෙන්නේ සුරංගි සම්බන්ධ ප්‍රකාශ 3 කි,

A - සුරංගි You tube හි අපේ අම්මා චැනලය බලාගෙන විවිධ රසවත් ආහාර පිසියි.

B - ඇය සෑම උදෑසනකම අවදි වූ ගමන් Night Time data මඟින් Facebook ගොස් තම ගිණුමේ සැරිසරයි.

C - අප රටේ නිෂ්පාදිත ටෙලිනාට්‍ය වලට වඩා හඬකැවූ විදෙස් ටෙලිනාට්‍ය වඩා ආකර්ශනීය බව ඇගේ මතයයි.

සුරංගිගේ මෙම වෙනස්කම් වලට හේතු වූ මාධ්‍ය බලපෑම් පිළිවෙලින් ඇතුළත් වරණය තෝරන්න.

i. චර්යාමය වෙනස, දෛනික න්‍යාය පත්‍රය සැකසීම, ආකල්පමය වෙනස

ii. දෛනික න්‍යාය පත්‍රය සැකසීම, ආකල්පමය වෙනස, චර්යාමය වෙනස

iii. ආකල්පමය වෙනස, චර්යාමය වෙනස, දෛනික න්‍යාය පත්‍රය සැකසීම

iv. චර්යාමය වෙනස, ආකල්පමය වෙනස, දෛනික න්‍යාය පත්‍රය සැකසීම

32. මාධ්‍යයන් සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - අවම පිරිවැය B - වේගවත් බව C - අභිසාරිතාව D - ආකර්ශනීය බව

මෙම ලක්ෂණ වලට අදාළ මාධ්‍ය පිළිවෙලින්,

i. රූපවාහිනිය, පුවත්පත, නව මාධ්‍ය, ගුවන් විදුලිය

ii. සම්ප්‍රදායික මාධ්‍ය, ගුවන් විදුලිය, නව මාධ්‍ය, රූපවාහිනිය

iii. සම්ප්‍රදායක මාධ්‍ය, නව මාධ්‍ය,රූපවාහිනිය, සමාජ මාධය

iv. රූපවාහිනිය, නව මාධ්‍ය, සමාජ මාධ්‍ය, සම්ප්‍රදායික මාධ්‍ය

33. පහත දැක්වෙන්නේ මාධ්‍ය උපකරණ කිහිපයක කාර්යයන්ය.

A - කාර්යාලයකට එන ලිපි වල දිනය සටහන් කරයි.

B - මුදල් ගණුදෙනුවකදී ඒ පිළිබඳ විස්තර යාන්ත්‍රික ව සිදු කරයි.

C - කෙටි, ලිඛිත සංදේශ හෝ සංඥා යැවිය හැකිය.

D - ලිපියකට නෛතික වලංගුභාවය හිමිකර දෙයි.

E - සියලුම ගණනය කිරීම් කරගත හැක.

ඉහත කාර්යයන් අතරින් කාර්යාලීය මාධ්‍ය උපකරණ පමණක් ඇතුලත් වරණය තෝරන්න

i. A, B, හා C ය. ii. B, C, හා D ය.

iii. C, D, හා E ය. iv. B, D, හා E ය.

34. A - පියවි ඇසට පෙනෙන දර්ශනයට සමාන වස්තු ඡායාරූපයට හසුකර ගත හැක.

B - පුළුල් පරාසයක ඇති වස්තු ඡායාරූපයට හසු කර ගත හැක.

C - ඈත පවතින වස්තුවල සමීප රූප ලබාගත හැක.

ඉහත ආකාරයට ඡායාරූප ලබා ගත හැකි කාච වර්ග පිළිවෙලින් ඇතුළත් වරණය වන්නේ,

i. දුර රූප කාච, සාමාන්‍ය කාච, පුලුල් කෝණ කාච

ii. සාමාන්‍ය කාච, පුලුල් කෝණ කාච, දුර රූප කාච

iii. සාමාන්‍ය කාච, දුර රූප කාච, පුලුල් කෝණ කාච

iv. පුලුල් කෝණ කාච, දුර රූප කාච, සාමාන්‍ය කාච

35. පහත දැක්වෙන්නේ පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ අවස්ථා කිහිපයකි.,

A - මුල් පිටපත පරිගණක මුද්‍රණ යන්ත්‍රයෙන් ලබා ගැනීම

B - අත්පිටපත සැකසීම

C - අක්ෂර යෝජනය

D - පිටු බැඳීම හා පිටකවරය යෙදීම

E - පිටු සැලසුම

මෙම අවස්ථා පිළිවෙලට ගොනු කළ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර තෝරන්න.

i. A,B,C,A,D ii. B,E,A,C,D

iii. B,C,A,E,D iv. B,C,E,A,D

36. ඔබ වෙත ලැබෙන දුරකථන ඇමතුම කවර දුරකථන අංකය සහිත දුරකථනයකින් අමතන්නේ දැයි දැනගැනීමට ඔබගේ දුරකථනයෙහි තිබිය යුතු පහසුකම වන්නේ,

i. IDD ය ii. CLI ය iii. C DMA ය iv. GPRS ය

37. පහත දැක්වෙන්නේ මාධ්‍යයන්ගෙන් ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජනයන් ය.

- වාග් කෝෂය පුළුල් වේ.
- පරිකල්පනය දියුණු වේ.
- අධ්‍යාපනය ප්‍රියජනක වේ.
- රස විඳීමට උගනියි

ඉහත ලක්ෂණ පිළිවෙලින් දැකිය හැක්කේ,

i. ගුවන් විදුලිය, පුවත්පත, නව මාධ්‍ය හා රූපවාහිනිය මගිනි

ii. පුවත්පත, ගුවන් විදුලිය, නව මාධ්‍ය හා රූපවාහිනිය මගිනි

iii. රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත් හා නව මාධ්‍ය මගිනි

iv. ගුවන් විදුලිය, පුවත්පත, රූපවාහිනිය හා නව මාධය මගිනි.

38. පුවත්පතක ඉඩ වෙන් කිරීමේ දී ප්‍රමුඛතම අවධානය යොමු වන්නේ,

i. ප්‍රවෘත්ති සම්බන්ධයෙනි.

ii. දැන්වීම් පිළිබඳව ය.

iii. කර්තෘ වාක්‍ය ගැන ය.

iv. විශේෂාංග පිළිබඳව ය.

39. ''සෑම පුරවැසියෙකුට ම භාෂාණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහසට හිමිකම් ඇත්තේ ය.'' මෙම ප්‍රකාශය අඩංගු වන්නේ,

i. මානව හිමිකම් ප්‍රකාශනයේ ය.

ii. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ ය.

iii. ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ය.

iv. බුදුධිමය දේපල පනතේ ය.

40. ගුවන් විදුලි සේවකයෙකු සිය ග්‍රාහකයන් ඇමතිය යුත්තේ,

i. ඉලක්ක ග්‍රාහකයා සිතින් මවාගනිමිනි.

ii. සමාජ විවිධත්වයට උචිත වන ලෙසිනි.

iii. මිතුරෙකු සමඟ කතා කරන අයුරිනි.

iv. තනි තනි පුද්ගලයා අමතන අයුරිනි.